**ජාතික අධ්‍යාපන ආයතනය**

**මහරගම**

# ලංසු ආරාධනයයි.

## ආරක්ෂක සේවය සැපයීම හා පවත්වාගෙන යාම 2023/2024 වර්ෂය සඳහා මිල ගණන් කැඳවීම.

## (NIE/LP/2022/76)

ජාතික අධ්‍යාපන ආයතනයේ මහරගම සහ මීපේ පරිශ්‍රයන්හි පිහිටි ගොඩනැගිලි සහ භූමියේ ආරක්ෂක සේවය සඳහා සුදුසුකම්ලත් පළපුරුදු ආරක්ෂක සේවා සපයන ලබන ආයතන වලින් මුද්‍රා තබන ලද ලංසුපත් කැඳවනු ලැබේ. සතියේ දිනවල පෙ.ව 9. 00 සිට ප.ව 3.00 දක්වා පහත සඳහන් ලියකියවිලි ප්‍රසම්පාදන නිලධාරී වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ටෙන්ඩර් ඒකකයෙන් ලංසුලියවිලි ලබා ගත හැක. ලංසුලියවිලි නිකුත් කිරීම 2022.12.06 දින ප.ව 3.00 න් අවසන් වේ.

(අ) ව්‍යාපාර නාම ආඥපනතේ 149 වන ඡේදය යටතේ හෝ සමාගම් පනත යටතේ ආරක්ෂක සේවය සපයන ආයතනයක් ලෙස වලංගු ලියාපදිංචිය හා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ 2022 වසර සඳහා ලියාපදිංචි වී තිබීම.

(ආ) ආපසු නොගෙවනු ලබන රු.1,000.00 ක මුදලක් ලංකා බැංකු ශාඛාව වෙත අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය, අංක 607628 දරණ ගිණුමට බැර කළ බවට ලදුපතක්.

සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි මුද්‍රා තබා **2022.12.08** දින ප. ව. 2.00 ට ප්‍රථම ලැබෙන පරිදි සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවීම හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන, මුදල් හා සහාය සේවා ) කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කල යුතුය. ලංසු පත්‍රය බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ‘‘ආරක්ෂක සේවය සැපයීම හා පවත්වාගෙන යාම’’ 2022/2023 වර්ෂය “NIE/LP/2022/76” අදාළ ටෙන්ඩර් ගොනු අංකය සඳහන් කළ යුතු ය. **2022.12.08** දින ප. ව. 2 .00ට ලංසුපත් විවෘත කරනු ලැබේ.

මෙම ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ අවසන් තීරණය ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය වේ.

මේ පිළිබඳ වැඩිදුර විස්තර සඳහා 0117601797, 0117601799 අමතන්න.

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම.
2022.11.17